# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: (94) 011- 2694560 Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: www.pubad.gov.lk Web Site


මගේ අංකය / எனது இல / My No: R/9/2/2013

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2015.12. 03

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට කුසලතා මත පත්කිරීම සඳහා වන තරඟ විභාගය - 2013</u>**

ඉහත සඳහන් තරඟ විභාගයේ ප්‍රතිඵල මත රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට කුසලතා මත බඳවා ගැනීම වෙනුවෙන් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ දෙසැම්බර් 09,10,11 දින වල පැවැත්වීමට තීරණය කර ඇත.

02. මේ වන විට කැඳවීම් ලිපි තැපැල් මඟින් යොමු කර ඇති අතර එහි සඳහන් දින වල අදාළ වේලාවට **කොළඹ 07, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයට** පැමිණෙන ලෙස කාරුණිකව දන්වමි.

03. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියට කුසලතා මත පත්කරනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයේ හා ජ්‍යෙෂ්ඨතාවය සහ පළපුරුද්ද මත ලබා දෙන ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත වේ. ඒ අනුව, එක් එක් අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද විභාග අයදුම්පතෙහි සඳහන් තොරතුරු අනුව ඔවුන් වෙත පිරිනමන ලද ජ්‍යෙෂ්ඨතාවය සහ පළපුරුද්ද සඳහා ලකුණු පෞද්ගලික ගොනුවෙන් සනාථ වන තොරතුරු සමඟ සැසඳේද යන්න පරීක්ෂා කර බලනු ලබන බව දන්වා සිටිමි. ඉහත සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම මත පමණක් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ කුසලතා මත අධිපන්තියේ තනතුරකට පත් කරනු ලැබීම සඳහා කිසිදු හිමිකමක් නොලබන බව අවධාරණයෙන් සඳහන් කරමි.

04. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් හා අමතර ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර, එම ඡායා පිටපත් සත්‍ය පිටපත් බවට අයදුම්කරු විසින් පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ දී සහතික කර භාර දිය යුතුය.

(අ). මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික (උප්පැන්න සහතිකය හා උපාධි සහතිකය(අදාළ නම්)
(ආ). ජාතික හැඳුනුම්පත
(ඇ). නමෙහි වෙනසක් ඇත්නම් ඒ පිළිබඳව දිවුරුම් ප්‍රකාශයක් ( රු.50.00ක මුද්දර අලවන ලද)
(ඈ). මෙම කැඳවීම් ලිපිය හා මීට අමුණා ඇති ආකෘති පත්‍රය (නිවැරදිව සම්පූර්ණ කර )
(ඉ). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2014 හි 3 ඡේදය අනුව ජ්‍යෙෂ්ඨත්වය සහ පළපුරුද්ද සඳහා උපයාගත් ලකුණු ප්‍රමාණය සනාථ කිරීමට අදාල ලිඛිත තොරතුරු ඇතුලත් ලිපිවල දෙපාර්තමේනතු ප්‍රධානියා විසින් සහතික කරන ලද ඡායා පිටපත්

05. නියමිත දින මෙම සමාන්‍ය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවලට සහභාගී නොවන්නේ නම් ඒ සඳහා වෙනත් දිනයක් ලබා නොදෙන හෙයින්, එවැනි ඉල්ලීම් සලකා නොබලන බව ද, අදාළ සහතික සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අවස්ථාවේදී අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු බව ද අවධාරණය කරමි.

කේ.වී.පී.එම්.ජේ.ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාශයේ ලේකම් වෙනුවට